
## 3.5 සරල රේඛා දෙකක් එකනෙක ඡේදනය වීමෙන් සෑදෙන ප්‍රතිමුඛ කෝණ අතර ඇති සම්බන්ධය විමසීම සඳහා උපකරණයක් නිමවීම හා භාවිතය

(අ) පෙර දැනුම

i. ප්‍රතිමුඛ කෝණ යුගල හඳුනා ගත හැකි වීම.
ii. ප්‍රතිමුඛ කෝණ ලෙස නොමග යා හැකි ප්‍රතිමුඛ කෝණ නොවන අවස්ථාද හඳුනා ගෙන තිබීම.

(ආ) උපකරණය සහ එහි උපාංග




(ඇ) උපකරණ නිමවුම හා කාර්යය පත්‍රිකාව

i. පිරිසිදු කළ " X-RAY" කඩදාසියකින් සෘජුකෝණාස්‍ර සිහින් පටි තුනක් කපා ගන්න.
ii. එම පටිවල AB, PQ, XY සරල රේඛා පෑනෙන් ලකුණු කරන්න.
iii. එම පටි තුනෙහි O ලක්ෂ්‍යය ලකුණු කර O සිදුරු කර ගන්න.
iv. එසේම NP හා NQ කෙටි පටි දෙකක් සමග NR දිග පටියක් ද සූදානම් කර N හරහා සිදුර විද ගන්න.
v. NP, NQ හා NR පටි තුනම N හරහා හෙයා බ්‍රෂ් කෙදි ඇණයකින් අමුණා රිවට් කර අමතර උපාංග සකසන්න.
vi. උපකරණය 07 සඳහා AB හා PQ පටි දෙක පමණක් 08 උපකරණ සඳහා AB,PQ,XY පටි තුනම ද පසුතලයක තබා O හරහා අමුණා ගෙන උපකරණ දෙකක් වෙන වෙනම සකසා ගන්න.
(අමතර උපාංග කෝණ මනුවක් ලෙස ද එහි දිග බාහුව අතින් අල්ලා ගැනීමට ආධාරකයක් ලෙස ද යොදා ගත හැකිය.)

(ඇ) උපකරණ භාවිතයට කාර්යය පත්‍රිකාව

i. උපකරණය 07 හි මෙන්ම 08හි ද අදාළ පටි O වටා භ්‍රමණය කිරීමෙන් AB, PQ, XY සරල රේඛාවල එක් පිහිටීමක් ලබා ගන්න.

ii. අමතර උපාංග ආධාරයෙන් අල්ලා O මත N පිහිටන සේ කෙටි බාහු දෙක (NP හා NQ) භ්‍රමණය කර උපකරණයේ එක් කොටසක පිහිටුම ලබා ගන්න.

iii. මෙහි ප්‍රතිමුඛ කෝණ නිවැරදිව හඳුනා ගනිමින් උපාංගය සකස් කර කෝණය ගලපා බලා ප්‍රතිමුඛ කෝණ අතර සම්බන්ධයක් වේ දැයි නිරීක්ෂණය කරන්න.

iv. සරල රේඛාවල පිහිටුම් වෙනස් කරමින් උපාංග (කෝණමනුව) මගින් ප්‍රතිමුඛ කෝණ අතර සම්බන්ධයක් වේ දැයි අන් අයගේ අදහස් විමසමින් නිරීක්ෂණය කරන්න.

v. ඔබගේ නිගමනය ජ්‍යාමිතික ප්‍රමේයයන් ලෙස ඔබේම වචනයෙන් ප්‍රකාශ කරයි.

(ඉ) අමතර

i. උපකරණයේ ස්වරූපය හෝ උපාංගයේ (විකල්ප කෝණ මනුවෙහි )හෝ එම අංග දෙකෙහිම වෙනස් ආකාර සැලසුම් මත ඔබේම වූ නිර්මාණයක් බිහි කිරීම.

ii. එම උපකරණ නිමවුම හා භාවිතය පිළිබඳ මෙවැනි කාර්යය පත්‍රිකාවක් සැලසුම් කර දැක්වීමෙන් මෙම කාර්ය භාරය වඩාත් හරවත් කිරීමට දායක වන්න.